# පූංචි ගෙවත්තට සඳුන් සමඳරා පාර දෙපැත්තට ඇහැල මූණමල්

**(සිටවිය යුතු පැල මෙන්ම ඒ පිළිබඳ උපදෙස් ද දක්වන මෙම ලිපිය පේරාදෙණිය වන උද්‍යාන අධිකාරී ඩී. ඊ. ඒකනායක මහතාගේ ලිපියක් ඇසුරින් සකස් වූවකි.)**

කැලෑ එළි කිරීමෙන් වෙච්ච විපත්තිය මහ හරවා ගන්න රජය මඟින් පැල සිටුවීමේ ව්‍යාපාරයක් ආරම්භ කළා. පසුගිය දිනවල මේ පිළිබඳ ලොකු උනන්දුවක් රටපුරාම තිබෙනු දක්නට ලැබුණා. ඉස්සර නම් වත්ත පුරාම, පාර දෙපැත්තේ කොස් පැල, කජු පැල. ඉබේටම පැල වෙච්චා. ඒත් දැන් එහෙම ඉබේට හැදෙන්න දෙන්නේ නැහැ. ටිකක් හොයල බලල යි පැල සිටුවන්නේ. අපි බලමු අළුතින් පැල සිටුවීමේ දී කල්පනාවට ගත යුත්තේ මොන කරුණු ද කියලා.

පොදු ස්ථාන, අළුත් පාර දෙපස, උද්‍යාන, නිවාස යෝජනා ක්‍රම හා හිස් බිම්වල පැල සිටුවීමේ දී එක්වරම සිතන්නේ අලංකාරය පමණක් ලැබෙන ගස් ගැන යි. ඒ වුනාට අලංකාරයත් ප්‍රයෝජනයත් දෙකම ලැබෙන පැල සිටවිය හැකි බව හුඟක් අය අමතක කරනවා.

අලංකාර ගස් ඕනෑනම් මුලින් ම කොළවල හැඩය වයනය (ගතියා ගැන හැඟීමක් ලබා ගන්න ඕන. මන්ද එක් වර්ගයෙන් වර්ගයට මෙම ලක්ෂණ වෙනස්වන නිසා. ගස් මුදුන් ද අලංකාරත්වයේ විශේෂ අංගයක්. බිත්තර, බඳුන්, කේතු ආකාර, ස්ථම්භාකාර, සිලින්ඩරාකාර වැනි විවිධ අන්දමේ මුදුන් තියෙනවා. සමහර කොළ ගොරහැඩියි. ඒවා අවට පරිසරයට චංචල කලබලකාරී ගතියකුයි එක් කරන්නේ. සිනිඳු කුඩා කොළ ඇති ගස් නිශ්චල, සාමකාමී සිත් ඇද ගන්නා බවක් අවට පරිසරයට ලබා දෙනවා. සමාන්තරව අතු විහිදෙන රවුම් හෝ බඳුන් වැනි මුදුන් ඇති ගස් නිශ්චල සාමකාමී පරිසරයක් සඳහා සුදුසු යි. කේතු ආකාර හෝ ස්ථම්භාකාර මුදුන් ඇති ගස් පාර දෙපස සිටුවීමට ගැලපේ. එකමුතු බවක් මින් දිස්වේ, ලොකු කොළ ඇති ගස් මේ සඳහා ගැලපෙන්නේ නෑ.

උද්‍යාන, විශාල ගෙවතු හා හිස් බිම්වල පැල සිටුවන විටද කොළවල හැඩය, ප්‍රමාණය පාට හා වයනය සැලකිල්ලට ගත යුතු යි. පාට මල්වලට සීමා වූවක් නොවේ. එය කොළවලට ද බලපාන්නක්. කොළ පාටේත් විවිධ වර්ණ කිහිපයක් ම තියෙන බව අමතක කරන්න එපා. ගෙවත්ත කුඩා එකක් නම් විශාල ගස්වල පැල සිටුවීම, අනතුරුදායකයි. දැඩි සුළං වලින් මෙන් ම මුල් ආදියෙන් ගෙදර අත්තිවාරමටත් අනතුරු විය හැකි යි. එනිසා ගෙවත්තට කුඩා හෝ මධ්‍යම ප්‍රමාණයේ ගසුයි වඩා හොඳ.

අලංකාරය හා වැදගත්කමයි නිතර එකට ගැටෙන්නේ, පාර දෙපැත්තේ ගස් හිටවන විට යි. පාර දෙපස කොස්, අඹ, රඹුටන් වැනි පළතුරු ගස් හිටවන්නයි මේ ගැන උනන්දුවක් දක්වන අය එක්වරම කියන්නේ. ලොකු ගෙඩි ඇති ගස් පාර දෙපස සිටුවීම එක අතකට කරදරයක් වෙනවා. අලංකාර, ඒකාකාරී ලක්ෂණ, මනා සෙවනක් දෙන හා අහිතකර පරිසර හා පස හා බැදී සිටිය හැකි කුඩා හෝ මධ්‍යම ප්‍රමාණයේ ගසුයි මේ සඳහා හොඳ. මනා හැඩයක් හා වයනයක් ඇති බෙත් ගස් වර්ගත් මේ සඳහා හොඳයි.

මේ අනුව **තෙත් කලාපයට**, මහෝගනි, නැඳුන්, පිහිඹිය හා ගම්මාලු ගස් මෙන් ම, ඇහැල, මූණමල්, මහුල්කරඳ වැනි බෙහෙත් ගස් වර්ග පාර දෙපස සිටුවීමට කදිම යි.

**වියළි** කලාපයේ පාරවලට පලු, කොහොඹ, ඇහැල, ගස් ගැලපෙනවා. **උඩරටට** කීන, වල් සපු, කපුරු, වුනා සයිප්‍රස් හා පයින් ගස් වර්ග ගැලපෙනවා.

**එක පාරක එකම වර්ගයේ පැල කෙලින් පේළිවලට සිටුවීමයි ඉතාමත් හොඳ. පාර**

දෙපැත්තේ විවිධ පැල වර්ග සිටුවීම නො ගැලපෙන පිළිවෙතක්.

තෙත් කලාප ගෙවතුවල කොස්, දෙල්, අඹ, රඹුටන්, අනෝදා, මැංගුස්ටින්, අලිගැට පේර, නමිනං, කොචින් ගොරක, ලොවි, ජම්බු, කාමරංගා හා බිලින් පැල සිටුවීම හොඳයි. වියළි කලාපයේ ගෙවතුවලට මොර, දිවුල් හා අඹ කදිම යි. පෙයාර්ස්, ඇපල්, වෙරිමෝයා හා කඳුකරයට ම විශේෂ පුංචි පේර උඩරට ගෙවතුවලට සුදුසු යි.

කේතුආකාර මුදුන් ඇති සාදික්කා හා කරාබු ගස් තෙත් කලාප ගෙවතු අලංකාරය වැඩි කරවනවා. මේ හැර මේවායින් ලැබිය හැකි ආදයමත් සුළු නොවේ. පිමෙන්ටෝ මෙවැනිම කුඩා කුළු බඩු ගසක්. මෙහි කොළ එළවළු රස කිරීමට යොදන අතර, වෙළු ගෙඩි වාණිජ අගයක් ඇත්තකි.

තෙත් කලාප ගෙවතුවල නෙල්ලි, මූනමල්, මහුල්කරඳ, අසෝකා, ඇහැල, ගම්මාළු, ලුණුවරණ, සමදරා, සුදු හඳුන්, රත් හඳුන්, බෙලි, මදටිය හා වට බංගා වැනි බෙහෙත් ගස් වර්ග වැවීම ද වැදගත්. මෙම ගස් කුඩා හා මධ්‍යම ප්‍රමාණ ඒවා වන අතර, කදිම සෙවනක් ද ලබා දෙනවා. වියළි කලාපයේ නෙල්ලි, අරළු, ගම්සූරිය, ඇහැල, රුක් අඳුන, ගොඩකඳුරු හා කොහොඹ වැවිය හැකි යි.

සේපාලිකා මල් සුවඳ අප කුල්මත් කර වන්නක්. ඒ වගේ ම තමයි, ඇට්ටේරියා, නා, සපු, හා වනසපු මල් සුවඳත්. මේවාත් ගෙවතු වල හිටවන්න අපි කවුරුත් කැමතියි. ඒ වාගේම වැරැද්දක් නැහැ.

උද්‍යාන හා හිස්බිම්වල සෙසු ගස් එක්ක කලවමට බෙහෙත් ගස් වවන්න පුළුවන්. සපු, බුලු, කොස්, දූරියන්, ලුණුමිදෙල්ල, කොට්ටඹ හා හල් තෙත් කලාපයටත් කොහොඹ, සියඹලා, තිඹිරි හා මී ගස් වියළි කලාපයටත් ඇල්බීසියා, වූනා, ඕක්, ඉයුකැලිප්ටස්, සයිප්‍රස් හා පයින් ගස් කඳුකර උද්‍යානවලටත් කදිම සෙවනක් හා සුන්දරත්වයක් ලබා දෙනවාට සැකයක් නැහැ.

## අළුතින් පැල හිටවන්නේ මෙහෙමයි

1. ඇට වලින් සාදගත් පැලම සිටුවන්න. ඒවා බද්ධ කිරීම්වලින් ගත් පැලවලට වඩා කල්පවතිනවා.
2. ලොකු ඇට වර්ග නම් මනාව සකස් කළ තවාන් වලත්, කුඩා ඇට නිසි පස් පුරවා සකස් කළ පෙට්ටියක හෝ පොඩි භාජනයක පැල කරගන්න.
3. සාදික්කා හා කරාබු වැනි ලොකු ඇට වර්ග නම් එක බැගින් පස් පිරවූ පොලිතීන් බෑගයක හෝ උණ බම්බුවක පැල කර ගැනීම වඩාත් සුදුසු ය.
4. තවාන් වලින් පැල ගෙන කෙළින් ම සිටවනවාට වඩා පැලය අඟල් 2 ක් පමණ වූ විට පොලිතීන් බෑගයක හෝ උණ බම්බුවක පැල කර ගෙන පසුව සිටවන්න.
5. වැසි කාලවල දී පැල සිටුවීම වඩාත් ප්‍රතිඵල සහිත යි.
6. ගස්වල අතු විහිදෙන අයුරු, පරිසරය හා ගස් සිටුවීමේ අදහස සලකා පැල දෙකක් අතර දුර තීරණය කර ගන්න. කුඩා ප්‍රමාණයේ ගස් නම් අඩි 25–30 අතරත් මධ්‍යම ප්‍රමාණයේ නම් අඩි 40–50 ත් අතර දුරක් සෑහේ.
7. වලක දිග පළල අඩු තරමින් අඟල් 18X18 ක් පමණක් විය යුතු යි. මීටත් කුඩා වලක සිටුවුවහොත් පැලය වැඩීමේදී දුර්වල විය හැක. පැල බොහොමයකට අඟල් 36X30 වලවල් ඉතා යෝග්‍යය. තෙත් කලාපයේ නම් වලක් පොළොවේ මට්ටමින් අඟල් 3 ක් උසට වනසේ පස් පුරවන්න. එවිට ජලය බැස යාම පහසු වේ. වියළි කලාපයේ නම් තෙතමනය රැක ගැනීම සඳහා ගැඹුරු වලක සිටුවන්න.
8. පැල තවානෙන් හෝ උණ බම්බුවෙන් ගෙන සිටුවීමේ දී මුල්වලට හානියක් නොකිරීමට වගබලාගන්න. උන බම්බු පැලයක් නම් ඇතුලේ වන පස නො සෙල්වන සේ උණ බම්බුව දෙපැත්තෙන් පලා ඉවත් කර පස් සහිත පැලය සිටුවන්න. පොලිතීන් බෑගයක් නම් තුන් හතර තැනකින් කපා ඉරා දමා ඒ සමඟ ම සිටවන්න.